# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1762/29 - 2012 ජුනි මස 13 වැනි බදාදා - 2012.06.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත**

14 වැනි වගන්තිය යටතේ නියෝගය

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය රිෂාඩ් බදියුදීන් වන මම, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ ද එකඟත්වය ඇතිව 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(1) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2011.11.21 දිනැති අංක 1733/5 දරන අති විශෙෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශිත උපලේඛනයේ, II වන හා III වන තීරුවල නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ අපනයනය කිරීම මත, අයකළ යුතු සෙස් බද්ද එයට අනුකූල IV වැනි තීරුවේ දක්වා ඇති ප්‍රමාණ සහ ඒකක අනුව 2012 ජුනි මස 15 දින සිට ක්‍රියාත්මක වන පරිදි සෙස් බද්දක් නියම කොට අයකර ගතයුතු බව විය යුතු බව මෙම නියෝගය මගින් ප්‍රකාශයට පත්කරමි.

රිෂාඩ් බදියුදීන්,
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය.

2012 ජුනි මස 13 වැනි දින,
කොළඹ,
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

උපලේඛනය

| සං.ව. ශීර්ෂය I | සංයෝජිත වර්ගීකරණ සංකේතය II | | විස්තරය III | සෙස් බදු අනුපාතය IV |
|---|---|---|---|---|
| 25.16 | | | ඍජු කෝණාස්‍රාකාර හැඩයේ (චතුරශ්‍රාකාර ඇතුළුව) කුට්ටිවලට හෝ පැතලි කැබලිවලට ඉරීමෙන් හෝ වෙනත් ක්‍රමයකින් කැපීම පමණක් කළා වූ හෝ නොකළා වූ රළු ලෙස හැඩ කැපුවා වූ හෝ නොකැපුවා වූ කළුගල්, පෝර්පිරි, බැසෝල්ට්, වැලිගල් සහ අනෙකුත් ස්මාරක හෝ ගොඩනැගිලි සඳහා වූ ගල්. | |
| | | | | |
| | | - | කළුගල් : | |
| | 2516.11 | – | රළු හෝ දළ ලෙස හැඩ කැපූ | ඝන මීටර් 1 ක ට රු. 24,000 |
| | 2516.12 | – | ඍජු කෝණාස්‍රාකාර හැඩයේ (චතුරශ්‍රාකාර ඇතුළුව) කුට්ටිවලට හෝ පැතලි කැබලිවලට ඉරීමෙන් හෝ වෙනත් ක්‍රමයකින් කැපීම පමණක් කළා වූ | ඝන මීටර් 1 ක ට රු. 12,000 |
| | 2516.20 | - | වැලිගල් | ඝන මීටර් 1 ක ට රු. 12,000 |
| | 2516.90 | - | අනෙකුත් ස්මාරක හෝ ගොඩනැගිලි සඳහා වූ ගල් | ඝන මීටර් 1 ක ට රු. 12,000 |

06-1095

1A - G 016203 — 935 (2012/06)    ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.